මහනුවර මහා නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මහනුවර මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහයහා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිතහා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මැද ඇළ සංවර්ධනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම්ගෙන් ලැබිය යුතු රු.8,533,842 ක් ගිණුම්ගත කර නොතිබුණි.	ජර්නල් සටහන් මඟින් නිවැරදි කර ගන්නා බව	නිවැරදිව ගිණුම් පිළයෙල කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ දී පළාත් පාලන ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති 05 කට අදාළව ලැබුණු රු.3,655,074ක මුදල් ප්‍රාග්ධන ආදායම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් වැය විෂයයට බැර කර තිබුණි.	සංවර්ධන වැය ශීර්ෂයෙන් වියදම් දරා තිබූ බැවින් අදාල වැය ශීර්ෂයට අයිභාර කරන බව.	ප්‍රාග්ධන ආදායම් ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ලෝක උරුම නගර ව්‍යාපෘති අරමුදල් ගිණුමෙහි ශේෂය රු.1,294,266 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල ඉතිරි ප්‍රතිපාදන එකතුව රු.971,887,255 ක් නිරවුල් කිරීමකින් තොරව වියදම් ලෙස ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.	ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව.	ණයහිමියන් නිවැරදිව පුරෝකථනය කර ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 09 ක් හා වගකීම් විෂයයක ශේෂයන් ඊට අදාළ උපලේඛනවල සඳහන් ශේෂයන් සමඟ සැසඳීමේ දී එකතුව රු. 247,245,127 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව	ගිණුම් ශේෂ ඊට අදාල උපලේඛන සමඟ සැසඳිය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ජල අංශයේ ලැබිය යුතු ජල ආදායම රු.383,317,040 ක් වුවද පරිගණක පද්ධතිය අනුව එම ශේෂය රු.376,272,288 ක් වූයෙන් රු.7,044,752ක නොසැඳීමක් නිරීක්ෂනය විය.	ගිණුම් ශේෂ අතර වෙනස පරිගණක පද්ධතිය මගින් නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ගන්නා බව	මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂයන් පරිගණක පද්ධති අනුව එකී ශේෂයන් සමඟ සැසඳිය යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් එකතුව රු.2,275,814,461 ක් වුවත් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ හා ප්‍රාග්ධනයට පරිත්‍යාගයෙන් දායකවීමේ ගිණුම එකතුව රු.2,271,617,127 ක් වීම හේතුවෙන් රු.4,197,334 ක වෙනසක් නිරීක්ෂණය විය.	2025 මූල්‍ය ප්‍රකාශණ විගණනය වෙත ඉදිරිපත් කිරීමේදී ගිණුම් ගලපා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව	ස්ථාවර වත්කම් එකතු වටිනාකම, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් හා පරිත්‍යාගයෙන් දායක වීමේ ගිණුම් එකතු ශේෂය සමඟ ගැලපිය යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු අංශයට ජල අංශයෙන් ලැබිය යුතු තාවකාලික ණය රු.144,586,056 ක් වුවත් එය ජල අංශයේ පොදු අංශයට ගෙවිය යුතු තාවකාලික ණය රු.139,486,056 ක් ලෙස දක්වා තිබීමෙන් රු.5,100,000 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	පෙර වර්ෂවලට අදාල වෙනසකි. සසඳා බැලීමෙන් පසු පිළිතුරු සැපයීමට කටයුතු කරන බව.	එකිනෙකට සැසඳිය යුතු ගිණුම් ශේෂ සැසඳෙන පරිදි ගිණුම් ගැලපිය යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජල අංශයේ වැට් අය කිරීමේ එකතුව රු.288,463,950 ක් වුවත් එය වැට් පාලන ගිණුමට රු.241,011,145 ක් ලෙස බැර කිරීම හේතුවෙන් රු.47,452,805 ක නොසැසඳීමක් නිරිකෂණය විය.	ගිණුම්කරණ හා පරිගණක පද්ධතියේ වෙනස්කම් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	පාලන ගිණුම් සමඟ සැසඳෙන පරිදි නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය.

(ඊ)	සමාලෝචිත වර්ෂයට අදාළ වරිපනම් බිල් කිරීම පරිගණක පද්ධතිය අනුව එකතුව රු.386,830,114 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.410,690,388 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.23,860,274 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	වරිපනම් බිල් කිරීම JE 07/05/2025 මඟින් ගිණුම් ගලපා නිවැරදි කිරීමට පියවර ගත් බව.	පරිගණක පද්ධතිය හා සසඳා ගිණුම් නිවැරදි කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයට අදාල ජල ආදායම, පරිගනක පද්ධතිය අනුව රු.1,338,950,516 ක් වුවත් ලෙජර් ගිණුම අනුව වර්ෂයේ ජල ආදායම රු.1,299,945,609 ක් වූයෙන් රු.39,004,907 ක නොසැසඳීමක් විය.	පරිගණක පද්ධතියේ වෙනස්කම් හඳුනාගෙන ගිණුම සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	-එම-

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 245,958,365 ක වත්කම් විෂයයන් 03 කට සහ වගකීම් විෂයයන් 02 කට අදාළව ලේඛන, උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගනණයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	මෙම ශේෂයන් හඳුනාගෙන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	එක් එක් ගිණුම් ශේෂ සනාථ කරන අදාල ලේඛන, උපලේඛන පවත්වා ගත යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභා ආඥා පනත **(252 අධිකාරය)**			
	247 (ඉ) වගන්තිය	අංක 28/12/28/14 ජෝර්ජ් ඊ ද සිල්වා මාවතේ පිහිටි පිඹුරු අංක 1205/BOD දරන වෙන්දේසියේ විකුණන ඉඩමෙන් සියයට 01 ක බද්ද වන රු.5,549,500 ක මුදල අයකර නොතිබුණි.	පිඹුරු පත් අංක 1205/BOD මඟින් කැබලි කර විකුණන ලද සහ විකිණීමට අපේක්ෂා කරන ඉතිරි ඉඩම් කැබලි සඳහා මහනුවර මහා නගර සභාවට අය විය යුතු සියයට 01 ක බදු මුදල අය කර ගැනීමට කටයුතු කරන බව.	අනුබෙදුම්කළ ඉඩම්වල විකුණුම් අගයෙන් බදු අයකර ගත යුතුය.

(ආ)	**2002 අගෝස්තු 09 දිනැති අංක 1249 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද 2000 මැයි 26 දිනැති මහනුවර මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථා මාලාව**			
(i)	I වැනි පරිච්ඡේදයේ II වන කොටස 14 වගන්තිය	සභාව වෙත ලැබිය යුතු මුදල් සඳහා චෙක්පත් අගරු වූ අවස්ථාවක අගරු චෙක්පත් වටිනාකම මුදලින් භාර ගැනීමට කටයුතු කළ යුතු වුවත් අවුරුදු 15ක සිට පැවත එන එකතුව රු.7,841,558 ක් වූ චෙක්පත් 63 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂයෙන් රු.538,694 ක මුදලක් අයකර ගෙන ඇති අතර, ඉතිරි රු.7,841,558 ක මුදල අදාල පාර්ශවයන් දැනුවත් කරමින් තවදුරටත් අයකර ගැනීමට කටයුතු කරන බව.	අගරු චෙක්පත්වලට අදාලව ලැබිය යුතු මුදල් නිරවුල් කර ගත යුතුය.
(ii)	1 වැනි පරිච්ඡේදයේ II කොටසේ 13(1) වගන්තිය	බදු ලබා දී තිබුණු ඉඩම් කොටස් 51කින් රු.111,332,699 ක බදු කුලී ආදායමක් අයකර නොතිබුණි.	මහා නගර සභාව පත්වූ පසු පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2013/06 චක්‍රලේඛය ප්‍රකාරව මෙම ඉඩම් නියමාණුකූල කිරීමට කටයුතු කරන බව.	හිඟ බදුකුලී අයකර ගත යුතුය.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 4.1 ඡේදය 4.6 හා 4.7 වගන්තිය**	නිලධාරිනියක් විදේශගත වීමේදී බැඳුම්කරයේ වටිනාකම රු.7,304,791 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.	විගණනයෙන් පෙන්වා දුන් පසු නිලධාරිනියගේ ඇප බැඳුම්කරය ආයතන සංග්‍රහයේ XV හි 4:7 අනුව නිවැරදි විය යුතු බව දන්වමි.	ඇප බැඳුම්කර වටිනාකම නිවැරදිව ගණනය කළ යුතුය.
(ඈ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**			
	මුදල් රෙගුලාසි 571(3)	වසර 02 ක කාලය ඉකුත් වූ වටිනාකම රු.244,425,149 ක් වූ තැන්පතු 583 ක් නිරවුල් කර නොතිබුණි.	කාලය ඉකුත් වූ තැන්පතු මු.රෙ.570 හා 571 ප්‍රකාරව ඉදිරි කටයුතු කරන බව.	කාලය ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතුය.

(ඉ) චක්‍රලේඛ

(i)	2022 ජනවාරි 12 දිනැති අංක 01/2020(i) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 වගන්තිය	රාජකාරි නිවාස දුරකථනය, ජංගම දුරකථනය හා අන්තර්ජාල සම්බන්ධතා සඳහා නිලධාරීන් 38 දෙනෙකුට මාසික දීමනාවක් වැටුප සමඟ ගෙවා තිබියදී එම නිලධාරීන් සඳහා 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලයට අදාළ රු.2,034,462 ක දුරකථන බිල්පත් මහා නගර සභා අරමුදලින් ගෙවා තිබුණි.	නිලධාරීන්ට නගර සභාවෙන් සපයා ඇති ජංගම දුරකථන සම්බන්ධතාවය රාජකාරි දුරකථනය ලෙස සලකා බිල්පත් පියවීම සුදුසු බව නිර්දේශ ලබා දී ඇත. එමෙන්ම නිලධාරියාගේ පෞද්ගලික ජංගම දුරකථනය, රාජකාරි නිවාස දුරකථනය හා අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා වන දීමනාව යොමුගත චක්‍රලේඛනයේ සඳහන් කරුණු වලට අනුකූලව ගෙවීම් කළ බව.	චක්‍රලේඛ ප්‍රකාරව දුරකථන දීමනා දෙකක් ලබාගැනීමට නොහැකි බැවින් වැඩිපුර ගෙවන ලද දීමනා අයකළ යුතුය.
(ii)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සභාව සතු වාහන 98 ක දීර්ඝ කාලයක සිට ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකර නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව සභාව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරන මෙන් වාහන අනුයුක්ත කරන ලද සියළුම දෙපාර්තමේන්තු වෙත දන්වා ඇති බව.	ඉන්ධන දහනය පරීක්ෂාව නියමිත කාලය තුල සිදුකළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.656,103,460 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.718,210,138 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් 03 කට අදාලව පිළියෙල කර ඉදිරිපත් කල බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2024 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු.38,321,267 ක් නිරවුල් කර නොතිබුණි.	ජල අංශය මඟින් ලබාදෙන වට්නාකම් අතර වෙනසක් පවතින බැවින්, එම වෙනසට හේතු සොයා නිවැරදි කර වහාම ලදුපත් නිකුත් කර නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ලැබීම් හඳුනාගෙන නිරවුල් කරගත යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

කොමසාරිස් වරයා විසින් ඉදිරිපත් කළ තක්සේරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස් කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස් කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
(i)	වරිපනම් හා බදු	1,813,439,000	1,786,309,583	2,213,789,037	293,816,588	1,313,439,000	1,229,426,926	1,195,785,986	721,296,042
(ii)	කුලී	295,938,000	279,508,560	185,457,247	275,131,902	295,938,000	256,913,388	214,419,265	181,080,589
(iii)	බලපත්‍ර ගාස්තු	45,001,000	44,862,954	44,862,954	-	41,001,000	37,926,246	37,926,246	--
(iv)	වෙනත් ආදායම්	850,539,000	751,040,610	883,253,090	172,397,758	850,539,000	830,043,693	840,903,061	304,610,238
	එකතුව	3,004,917,000	2,861,721,707	3,327,362,328	741,346,248	2,500,917,000	2,354,310,253	2,289,034,558	1,206,986,869

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) **වරිපනම් හා බදු**		
සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.293,816,588ක් වූ අතර, ඉන් ඒකකයක හිඟය රු.100,000ක් රු.1,000,000 ක් අතර පරාසයක හිඟව පැවති වරිපනම් ඒකක 399 කින් රු.109,386,156 ක්ද, ඒකකයක හිඟය රු.1,000,000 ක් ඉක්මවා තිබුණු වරිපනම් ඒකක 12 කින් රු.30,052,930 ක් හිඟ ශේෂයන් විය.	හිඟ ආදායම් අයකර ගැනීමටත්, කපාහැරිය යුතු වරිපනම් කපාහැරීමටත්, වැරදි බිල්කිරීම් නිවැරදි කිරීමටත්, කටයුතු කරන බව.	අයකර ගත හැකි සියළු වරිපනම් අයකර ගත යුතු අතර, නිරවුල් කළ යුතු ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය.

	මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 256 වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ ශේෂ අය කර නොතිබුණි.		
(ආ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවට අයත් වෙළඳ සංකීර්ණ 03 ක කඩ කාමර 54 කින් රු.10,763,783 ක් වසර 02 ත් වසර 06 ත් අතර කාල පරාසයක සිට අයකර ගෙන නොතිබුණි.	හිග කඩකුලී අයකිරීමට ක්‍රියාමාර්ග ගැනීම හා අයකළ නොහැකි මුදල් කපාහැරීමට අනුමැතිය ගන්නා බව.	හිඟ කඩ කුලී අයකර ගත යුතුය.
(ii)	පේරාදෙණිය තානායමෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාල බදු කුලී එකතුව රු.16,834,700 ක් අයකර නොතිබුණි.	මහා නගර සභා කළමනාකරණය හා අදාල ආයතනයේ නිලධාරීන් සමග සාකච්ඡා කල අතර එහිදී මෙම මුදල් ගෙවීමට කටයුතු කරන බව හා සෑම මසකම ගෙවිය යුතු හිඟ කුලිය සඳහන් කරමින් වැට් ඉන්වොයිස් යැවීමද සිදු කරන බව.	බදු මුදල් කාලීනව අය කළ යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ආදායම් එකතුව රු.383,317,040 ක් විය. ඉන් එක් ජල පාරිභෝගිකයෙකුගේ හිඟය රු.100,000 සිට රු.500,000 දක්වා ජල පාරිභෝගිකයින් 416 ක හිඟය රු.76,998,193 ක් වන අතර, රු.500,000 සිට රු.1,000,000 පරාසයක හිඟ හිටි පාරිභෝගිකයන් 13 ක ගෙන් රු.21,446,739 ක් හා රු.1,000,000 ක් ඉක්මවූ ජල පාරිභෝගිකයන් 40 කගෙන් රු.114,172,626 ක හිඟ ශේෂයන් විය.	ජල ගාස්තු නොගෙවන සියළුම පාරිභෝගිකයනින් හට විසන්ධි දැන්වීම් යොමු කර එසේ විසන්ධි දැන්වීම් සඳහා ප්‍රතිචාර නොදක්වන පාරිභෝගිකයින්ගේ ජල සැපයුම විසන්ධි කිරීමට කටයුතු යොදා ඇති බවත් රජයේ ආයතනවලින් ජල බිල්පත් පියවීමේ ප්‍රගතිය දැනට යම් කිසි ඉහළ මට්ටමක පවතින බව.	හිඟ ජල ගාස්තු කඩිනමින් අය කළ යුතුය.

(ii)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සමාන ජල මීටර් අගයන් සහිත (Same Reading) පාරිභෝගිකයන් 926 දෙනෙකුගෙන් රු.4,502,815 ක් වර්ෂයකට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.	අක්‍රීය ජල මනු යාවත්කාලීන කිරීම, පදිංචියෙන් තොර ජල පාරිභෝගිකයින්ට ලිපි යොමු කිරීම, මනුව සොයාගත නොහැකි ස්ථාන පරීක්ෂා කර විසන්ධි ක්‍රියාවකට යොමු කිරීම වැනි මනු තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කරනු ලබන බව.	අක්‍රීය ජල මනු ඉවත් කර නව ජල මනු සවිකර නිසි පරිදි ආදායම් රැස් කළ යුතුය.

(ඈ) **මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.54,831,030 ක් විය.	මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	ආදායම් අයකර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී දිරන කසල ප්‍රමාණයෙන් සියයට 05 ක අවම ප්‍රමාණයක් පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගෙන ඇති බවත්, රැස් කර තිබූ කසල ප්‍රමාණයෙන් සියයට 95 ක්ම භාවිතයට ගෙන නොතිබුණු අතර, නිෂ්පාදිත පොහොර අලෙවි කිරීමට නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. ප්‍රතිචක්‍රීය කරණය කළ නොහැකි නොදිරන කසල, පරිසරයට බැහැර කිරීම අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ගෘහස්ථ වගා කටයුතු සඳහා මෙම කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑ.5 ඇසුරුම් ආකාරයෙන් අලෙවි කිරීමටත්, එමෙන්ම සභා යෝජනා මත වසම් මට්ටමින් අලෙවි කිරීමට කටයුතු කළත් එයද සාර්ථක නොවීය. එම නිසා කි.ග්‍රෑ. 05 ඇසුරුම් රු.60 දක්වා අඩුකොට ලාභයක් නොමැති වුවත් කසල ප්‍රශ්නයට විසඳුමක් ලෙස නගර මධ්‍යයේ, රථගාල සහ ගොහාගොඩ නිෂ්පාදනාගාරයෙන් අලෙවි කිරීමට පියවර ගන්නා ලද බව.	සභාව සතු කසල කළමනාකරණය කිරීමටත්, නිෂ්පාදන විකුණා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	මහා නගර සභාවේ කලාපවල 2022-2024 කාලය සිට පැවති රු.1,557,950 ක් වටිනා කසල බඳුන් 109 ක් මහජනතාවට නිකුත් නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා කර තිබුණි. මේ හේතුවෙන් අරමුණුගත කාර්යය ඉටුවී නොතිබුණි.	අදාල ක්ෂේත්‍ර තුල වසම් 45 ක සේවය කරන ප්‍රජා සෞඛ්‍ය සහායකට කසල බඳුන් මහජනයාට ලබාදෙන ලෙස උපදෙස් දී ඇත. කෙසේ නමුත් මෙම කසල බඳුන්වල මිල වැඩිවීම හේතුවෙන් ජනතාව ලබා නොගන්නා බව.	අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර කසල බඳුන් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ජල පාරිභෝගිකයන්ගේ ජල බිල්පත් පරිසනක මුද්‍රිත සටහන් අනුව සමහරක් ජල පාරිභෝගිකයන් ජල ගාස්තුවක් නොගෙවා තිබියදී මුද්‍රිත සටහනේ ගෙවූ බවට මුද්‍රණය වීමෙන් ජල පාරිභෝගිකයාගේ ජල ගාස්තු අතිරික්තයක් නිර්මාණය වී තිබීමත්, සමහරක් ජල පාරිභෝගිකයන් ගෙවන ලද ජල ගාස්තුව දෝෂ සහගතව ඊට වඩා වැඩි අගයකින් ගෙවූ බවට මුද්‍රණය වීමෙන් ද, ජල ගාස්තු අතිරික්තය නිර්මාණය වීම හේතුවෙන් පරීක්ෂණයට භාජනය වූ ජල පාරිභෝගිකයන් 06 දෙනාගෙන් රු.835,111 ක් සභා අරමුදලට අලාභයක් සිදුකර තිබුණි.	පාරිභෝගිකයා විසින් ගෙවීම් සිදු කරන අවස්ථාවන්වල පාරිභෝගික අංකයන් වැරදීමකින් වෙනස් පාරිභෝගික ගිණුමට එම මුදල බැර විය හැකි බව.	පරිගණක පද්ධතියේ දෝෂයන් නිවැරදි කර නිසි අධීක්ෂණය යටතේ ජල ගාස්තු අයකළ යුතුය.

3.3 දෘශ්‍ය අක්‍රමිකතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 12 අංක 8/7 දරන මහා සභා තීරණ හා 2023 නොවැම්බර් 30 දිනැති අංක 746 දරන කළමණාකරන කමිටු තීරණ මගින් ග්‍රීස් නිෂ්පාදනයට සම්බන්ධ නියෝජිතායතන වලින් මිල ගණන් කැඳවීමට තීරණය ගෙන තිබියදී එවැනි නියෝජිතායතනවලින් මිල ගණන් කැඳවීමකින් තොරව වෙනත් බාහිර ආයතන මගින් පමණක් මිල ගණන් කැඳවා නියෝජිතායතවල මිල ගණන්වලට වඩා අධික මිල ගණන් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන්ගෙන් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 19,860,300 ක ග්‍රීස් කිලෝ ග්‍රෑම් 4140 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව ග්‍රීස්	මහනුවර මහා නගර සභාව මේ දක්වා ග්‍රීස් මිලදී ගැනීම සඳහා අනුගමනය කර ඇත්තේ ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවීමේ ක්‍රමය යටතේ බවත්, නියෝජිත ආයතන වෙතින් හෝ වෙනත් ආයතන වෙතින් ලංසු සඳහා ආරාධනා කර නොමැති බව.	මහා නගර සභා අරමුදලට උපරිම ලාභයක් සිදු වන ආකාරයට ප්‍රසම්පාදන ක්‍රමවේදය හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු අතර අලාභයන් සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.

	නිෂ්පාදනයට සම්බන්ධ නියෝජිතායතනවල මිල ගණන් සලකා නොබැලීම හේතුවෙන් එකතුව රු. 9,637,560 ක් වැඩිපුර ගෙවා තිබුණි.		
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාළව සිමෙන්ති මිලදී ගැනීමට 2024 මැයි 20 දින පලකළ පුවත්පත් දැන්වීමට අනුව ලබා ගත් මිල ගණන් 2024 ජූනි 12 දින විවෘත කිරිමේදී සිමෙන්ති කිලෝ ග්‍රෑම් 50 මිටියක මිල රු. 1673.73 ක් දක්වා අඩුවී තිබුණි. එම අඩුවූ මිලට සිමෙන්ති මිලදී ගැනීමට හැකියාව තිබුණද 2024 ජූලි 02 සිට 2024 අගොස්තු 28 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 04කදී රු. 2,250 බැගින් වූ වැඩි මිලකට සිමෙන්ති මිටි 2400 ක් මිලදී ගැනීම හේතුවෙන් රු. 1,383,048 ක අලාභයක් සිදුව තිබුණි.	පෙන්වා දී ඇති පරිදි වර්ෂය පුරා මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඒ අනුව මිල ගණන් විචලනය/ වෙනස්වීම අනුව මිලදී ගැනීම් සිදු කර ඇත. එබැවින් ඉදිරියේදී ද ගිවිසුම්ගත වුවද ඇණවුමක් නිකුත් කිරීමේදී වර්තමාන වෙළඳපොළ මිල ගණන් එම ගිවිසුම්ගත ආයතනයෙන් විමසා ඒ අනුව මිලදී ගැනීමට කටයුතු කරන බව.	මහා නගර සභා අරමුදලට උපරිම ලාභයක් සිදු වන ආකාරයට ප්‍රසම්පාදන ක්‍රමවේදය හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු අතර අලාභයන් සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.
(ඇ)	ක්‍රීඩා දෙපාර්තමේන්තුව වෙත ක්‍රීඩා උපකරණ ලබාගැනීමේදී අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරු තෝරාගෙන තිබුණද එම ආයතනයේ උපකරණ සැපයීමට නොහැකි බවට ලිඛිත සාක්ෂි ලබාගැනීමකින් තොරව වැඩිමිල ඉදිරිපත් කළ සැපයුම්කරු තෝරාගෙන මිලදී ගැනීම හේතුවෙන් රු.1,320,477 ක පාඩුවක් සිදුකර තිබුණි.	අදහස් දක්වා නොමැත	එම
(ඈ)	සමාලෝචිත වර්ෂය තුල රු.3,420,000 ක ක්‍රීඩා හා කායවර්ධන උපකරණ මිලදී ගැනීමට අදාල මිල ගණන් 4ක් ලැබී තිබුණු අතර අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවන් පිළිබඳ පරීක්ෂාවට අනුව එකම ලිපිනයේ එකම සමාගමේ මිල ගණන් බව නිරීක්ෂණය වූයෙන් ඉදිරිපත් කළ ව්‍යාජ මිල ගණන් පදනම් කරගෙන මිලදී ගෙන ඇති බව නිරීක්ෂණය විය.	Sun Energy Holding පුද්ගලික සමාගම සහ Eser Marketing Fitness පුද්ගලික සමාගම යන ආයතන දෙකටම මිල ගණන් කැඳවීමට දන්වා යවා ඇති අතර එම ආයතන දෙකෙන්ම මිල ගණන් ඉදිරිපත් කිරීමේදී Sun Energy Holding පුද්ගලික සමාගම Treadmill American Fitness T 55A Taiwan යන්ත්‍රය රු. 689, 000 කටද Eser Marketing Fitness පුද්ගලික සමාගම Treadmill XT 185 යන්ත්‍රය රු. 703,000 කටද ලෙස , මාදිලිය සහ සන්නාමය වෙනස් ආකාරයෙන් මිල ගණන් දෙකක් ඉදිරිපත් කර ඇති බව.	කාය වර්ධන උපකරණ මිලදී ගැනීමට පෙර උපකරණ පරික්ෂා කිරීමට යාමේදී මෙම ආයතන සම්බන්ධව කරුණු අනාවරණය නොකිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභාවට පවරා දුන් 1975 ජූලි 14 දිනැති අංක 6980 දරන මූලික පිඹුරේ අංක 02 බිම් කොටස් පර්චස් 21.70 ක කොටසක පුද්ගලයෙකු අනවසරයෙන් පදිංචි වී ඇති අතර, අනවසර පදිංචිකරු එම ඉඩමෙන් කොටසක් වෙනත් පුද්ගලයෙකුට පවරා දී තිබුණි. ඉහත පවරාගත් අය ව්‍යාජ ඔප්පුවක් සකස් කර පසුව භාර්යාවට පැවරූ බවට ප්‍රකාශන ඔප්පුවක් සකස් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ මණ්ඩලයක් පත් කර පරීක්ෂණ වාර්තා ලැබුනු පසු ක්‍රියාමාර්ග ගන්නා බව.	අනවසර පදිංචිකරුවන් හා ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන වත්කම් ආරක්ෂා කළ යුතුය.
(ආ)	කටුගස්තොට නගරයේ වරිපනම් අංක 205 හා 207 දරන මහා නගර සභාවට අයත් පර්චස් 2.22 බැගින් වූ ඉඩම් කැබලි 02 ක බදු ගිවිසුමකින් තොරව හා ගාස්තු අය කිරීමකින් තොරව පාර්ශව දෙකකට ව්‍යාපාර කටයුතු ඉටුකිරීමට මහා නගර සභාව ඉඩ ලබා දී තිබුණු අතර, එම ඉඩම් තුල මහල් 03 ක් හා 02 ක් වශයෙන් ගොඩනැඟිලි අනවසරයෙන් ඉදිකරමින් පවතින බවත් නිරීක්ෂණය විය.	නව සභාවක් පත් වන තුරු ඉඩම් බදු ලබාදීමේ කටයුතු තාවකාලිකව නවතා ඇති බැවින් ඉදිරි සභාවක් පත්වී මෙන් පසු අදාළ ලියවිලි අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිත බව.	මහා නගර සභාව සතු ඉතා ඉහළ වාණිජ වටිනාකම් සහිත ඉඩම් විධිමත්ව හා ඵලදායීව උපයෝජනය කළ යුතු අතර, අනවසර කටයුතු සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	කටුගස්තොට මාතලේ පාරේ අංක 88 ස්ථානයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 ජනවාරි 04 දින සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර තිබුණද, එය අනුමැතියකින් තොරව මහල් 04 ක් හා නිවාස 02 කින් යුත් ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණි. සභාව මේ සම්බන්ධයෙන් කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.	අනවසර ඉදිකිරීම් සම්බන්ධව අනවසර නිවේදන නිකුත් කර නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	සැළසුම් අංශයේ කටයුතු නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම විධිමත් කළ යුතු අතර, නිසි පරිදි පසු විපරම් කටයුතු පවත්වාගත යුතුය.

(ඈ)	වරිපනම් අංක 67 හා 69 දරන ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2012 ඔක්තෝබර් 11 දින වසරක කාලයක් සඳහා සංවර්ධන බලපත්‍රය ලබාදී තිබුණද 2024 ජූලි 17 දින වන විට එහි වැඩ අවසන් නොකර කාලය දීර්ඝ කර නොගැනීම සම්බන්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට 2024 ජූනි 10 දින සැලසුම් කමිටුව නිර්දේශ ලබාදී තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාල ඉදිකිරීම් කරු වෙත 2016.06.27 දින ලබාදී ඇති සැලසුම් කමිටු තීරණයට අනුව 442 දරණ සංවර්ධන බලපත්‍රයට අනුකූලව ඉදිකිරීම් සිදුකළ යුතු බවට දැනුම් දී ඇති අතර, මෙතෙක් එම සැලසුමට අදාලව ඉදිකිරීම් සිදුකර නිම කර අනුකූලතා සහතික අයදුම් කර නොතිබීම හේතුවෙන් මෙම ඉදිකිරීම් සම්බන්ධව නැවත පරීක්ෂාවක් සිදු කර නොමැති බව ගොනුව අනුව පෙනී යන බව.	සැළසුම් අංශයේ කටයුතු නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම විධිමත් කළ යුතු අතර, නිසි පරිදි පසු විපරම් කටයුතු පවත්වාගත යුතුය.

3.5 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2017 පෙබරවාරි 01 දින උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මුදල් ලැබීම් පදනම මත සති පොළ වෙළඳුන් සඳහා ඇහැලේපොළ කුමාරිහාමි මාවතේ අමානෝ තහඩු ආවරණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවූ රු.1,714,200ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන බව.	අත්තිකාරම් කාලීනව ප්‍රතිපූර්ණය කර ගත යුතුය.
(ආ)	ඉකුත් වර්ෂයේ අනාවරණය කරගෙන තිබුණු එකතුව රු.17,125,780ක අක්‍රමිකතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ අවසන් කර අයකර ගැනීම් සිදු කර නොතිබුණි.	මු.රෙ.156(1) හානි පිළිබඳ වගකීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා ක්‍රියා කර මු.රෙ.104(4) පරීක්ෂණවල නිර්දේශයන් මේ වන විට නිකුත් කර නොමැති බැවින් තව දුරටත් අයකර ගැනීමට ඇති බව.	අදාළ පරීක්ෂණ කඩිනමින් අවසන් කර අලාභයන් අයකර ගැනීමටත්, අක්‍රමිකතා සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 10 ක එකතුව රු.179,293,880ක් විය. ඉන් වසර 01 ත් 03 ත් අතර කාලයට අදාල ශේෂය එකතුව රු.75,049,053ක් හා වසර 03 ක් ඉක්ම වූ ශේෂය එකතුව රු.95,686,505 ක් විය.	ලැබිය යුතු හිග බදු මුදල් හා ටෙන්ඩර් ගාස්තු අය කර ගැනීම සඳහා අවසන් නිවේදන නිකුත් කරන ලද බවත්, තව දුරටත් ගෙවීම් සිදු කර නොමැති කඩ හිමියන්ට එරෙහිව ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නාගරික නීති නිලධාරි වෙත යොමු කර ඇති බව.	ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය.

3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුල රු.9,985,000 ක් වටිනා මිලි මීටර් 10, 12 හා 20 ප්‍රමාණයේ SR වර්ගයේ දහර වානේ කම්බි 9900 ක් අවම මිල ඉදිරිපත් කළ ආයතනයෙන් මිලදී ගැනීමට ප්‍රසම්පාදන හා කළමණාකරන කමිටුව තීරණය කර තිබුණි. එසේ ලබාගත් මි.මී. 12 හා 20 කම්බි තත්ත්ව පරීක්ෂාව සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයට යොමුකර වාර්තා ලබාගෙන තිබුණු අතර, එම වාර්තා අනුව තත්ත්ව පරීක්ෂණයෙන් අසමත් වී එම තොග ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ තිබියදී මි.මී.10 කම්බි සැපයුම්කරුගේ ඉල්ලීම මත පේරාදෙණිය විශ්ව විද්‍යාලයට නොයවා, මොරටුව විශ්ව විද්‍යාලයට යොමුකර, තත්ත්ව පරීක්ෂණ සමත් වූ බවට වාර්තා ලබාගෙන මි.මී. 10 කම්බි 7500 ක් මිලදී ගැනීම සඳහා රු.7,336,650 ක් වැය කර තිබුණි. මේ හේතුවෙන් ලබාගත් වාර්තා මතභේදයට තුඩු දී ඇති බවක් නිරීක්ෂණය විය.	මහනුවර මහා නගර සභාව විසින් කම්බි 10mm, 12mm, 20mm Steel Bar මිලදී ගැනීම සම්බන්ධයෙන් රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගෙන ඇති අතර ,10mm කම්බි මොරටුව විශ්ව විද්‍යාලය මහින්ද ,12mm, 20mm පේරාදෙණිය විශ්ව විද්‍යාලය මහින්ද අවස්ථා දෙකකදී ලබාගෙන ඇත .ඒ අනුව 12mm, 20mm කම්බි පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් අදාල පිරිවිතරයන්ට නොමැති බවත් ,මොරටුව විශ්ව විද්‍යාලයේ අදාල පිරිවිතරයන්ට ගැලපෙන බවත් ,තත්ත්ව වාර්තා ලබාගෙන ඇති බව.	මි.මී.10, 12, 16, 20 සියළුම කම්බි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිදුකළ යුතුව තිබියදී හා ඒ කාලය තුල වැඩ වර්ජන අවසන් බැවින් සියළු කම්බි පේරාදෙණිය විශ්ව විද්‍යාලය සිදු කළ හැකිව තිබුණි.

3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රීඩා භූමි දෙපාර්තමේන්තුව සතුව තිබුණු ප්‍රජා මණ්ඩල 08 ක් මාස 02 ත් වසර 05 ත් අතර කාල පරාසයක සිට වසා දමා තිබුණි. වසා දමා තිබුණු ප්‍රජා මණ්ඩලවල දළ වශයෙන් රු.1,862,039 ක කායවර්ධන යන්ත්‍ර හා උපකරණ , ක්‍රීඩා භාණ්ඩ හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිෂ්කාර්යව පැවතුණි. ගැටඹේ ක්‍රීඩාංගණයේ සිදු කළ භෞතික පරීක්ෂාව අනුව දී ක්‍රිකට් ඇකඩමිය සඳහා මිලදී ගත් රු.169,300 ක් වටිනා භාණ්ඩ තොගයක් නිෂ්කාර්යව පැවතුණි.	කාර්යය මණ්ඩල පුරප්පාඩු සපුරාලීමට කටයුතු කළ පසු අදාල ප්‍රජා ශාලා විවෘත කර එම උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට ලබාදිය හැකි බව.	වත්කම් ඵලදායීව උපයෝජන යකර මහජන සේවාවන් නිසි පරිදි ඉටුකළ යුතුය.
(ආ)	සභාව සතුව පැවැති වටිනාකම රු.12,446,987 ක් වූ වාහන 04 ක් වසර 07 ත් වසර 10 ත් අතර කාලයක සිට නිෂ්කාර්යයව හා ඌන උපයෝජිතව පැවතුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරුවක් ලබාගෙන ටෙන්ඩර් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් අංක D4C හා D41A03 දරන යන්ත්‍ර යකඩ බරට හෝ යන්ත්‍රයක් ලෙස විකිණීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	අළුත්වැඩියා කර උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) (i)	මහා නගර සභා ආඥා පනතේ 40(1)(ඊ) වගන්තිය ප්‍රකාරව, විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සහස් උයන වෙළඳ කුටි 100 ක් දීර්ඝ කාලීනව බදු පදනම මත වසර 15 ක් සඳහා බදු දී තිබුණි. මෙම වෙළඳ කුටි සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු 02 ක් ඉදිරිපත් කර තිබුණද, එම තක්සේරු ක්‍රියාත්මක කර කුලී අය කිරීමට කටයුතු කර නොතිබුණි.	පළමු තක්සේරුව මඟින් ලබා දී ඇති දෛනික කඩකුලිය හා මාසික කඩ කුලිය සම්බන්ධව පවතින වෙනස හා ඒ වන විට එම පරිශ්‍රය බදු ලබාදී ඇති බවත් දන්වා නැවත තක්සේරුවක් 2023 දෙසැම්බර් 07 දිනැතිව ඉල්ලා වෙළඳ කුටි 100 සඳහා රු.664,000 ක මාසික බදු කුලී තක්සේරුවක් 2024 ඔක්තෝබර් 30 දිනැතිව ලබාදී ඇත. ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙස අදාල බදු කරුවන්ට දන්වා ඇති බව.	පනතේ සඳහන් අනුමැතිය නිසි පරිදි ලබාගෙන සභාවට අලාභයක් සිදු නොවන ආකාරයට තක්සේරු වාර්තා අනුව කුලී අයකර ගත යුතුය.

(ii)	සහස් උයන වෙළඳ කුටි 100 ක් මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වසර 15 කට බදු දීම සඳහා 2023 මැයි 12 වන දින සිදු කළ ටෙන්ඩර් කැඳවීමට අනුව, ලංසු 02 ක් ඉදිරිපත් කර තිබුණු අතර, එක් ලංසුවක් ප්‍රතික්ෂේප කර තිබුණු අතර එය ව්‍යාජ ලෙස සකස් කර තිබුණු බවක් නිරීක්ෂණය විය.	ලංසු ඉදිරිපත් කළ ආයතන 02 න් එකක ඉදිරිපත් කරන ලද අත්සන් සහ අනෙකුත් කාරණා පිළිබඳව ඇගයීම් සිදු කළද, අවසන් ප්‍රතිඵලය වන්නේ මූලික සුදුසුකම් සපුරා නොමැති නිසා මෙම ප්‍රතික්ෂේප කර ඇත. තවද, ටෙන්ඩරය කියවන අවස්ථාවේදී ලංසුකරුවන් පැමිණ සිටි අතර, මෙම ලංසුකරු විසින් ලංසු සුරක්ෂණය ඉදිරිපත්කර නොමැති බව.	තරඟකාරී ලංසු ක්‍රමය යටතේ මහා නගර සභා අරමුදලට අලාභයක් සිදු නොවන ආකාරයට කටයුතු කිරීම හා ඊට පරිබාහිරව අක්‍රමිකතාවයන් සිදු කරන ලංසුකරුවන් සම්බන්ධව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර තරඟකාරී ලංසු ක්‍රමයට සිදුවන බාධා ඉවත්කර ගත යුතුය.

3.9 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**සභා ගොඩනැඟිල්ලේ බිම් මහලේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම - රු.4,875,552**		
(i)	2024 ජනවාරි 30 දිනැති හා අංක 4/4/ඉංජිනේරු (පොදු) දරන පළාත් පාලන ඉංජිනේරුගේ උපදෙස් අනුව මිලියන 05 ට අඩු කර්මාන්ත සඳහා උඩිස් වියදම් හා ලාභාංශ සියයට 20 ක් එකතු කරන ලෙස දන්වා තිබියදී 2024 අගෝස්තු 30 දින පිළියෙල කළ ඇස්තමේන්තුව සියයට 26 ක ලාභාංශ ඇතුළත් කර වැඩ විෂයයන් 37 කට රු.371,194 ක් වැඩිපුර ගෙවා තිබුණි.	2024 ගොඩනැඟිලි සම්මත මිල රේටයන්හි (BSR) සඳහන් මිලියන 05 ට අඩු ඇස්තමේන්තු සඳහා පිරිවැය හා ලාභාංශ සියයට 26 ක් ලෙස රේටයට එකතු කිරීමෙන් වනඅතර මෙම ඇස්තමේන්තු තුල මිලියන 05 ට අඩු ඇස්තමේන්තුවක් බව.	ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාල නියාමන ආයතන ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ii)	වැඩ විෂයය අංක 26 යටතේ බිම් ඇතුරුම් (Floor tile) සඳහා රු.236,000 ක්ද, වැඩ විෂයය අංක 27 යටතේ බිත්ති ඇතුරුම් (Wall tile) සඳහා රු.795,000 ක්ද, ගෙවීම් කර තිබුණි. අතුරා තිබූ බිම් උළු ප්‍රමාණය භෞතික පරීක්ෂාව අනුව බිම් ඇතුරුම් හා බිත්ති ඇතුරුම් සඳහා රු.255,960 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. වැඩ විෂයය අංක 27 යටතේ බිම් මහල වැසිකිලියේ බිත්ති ඇතුරුම් (Wall Tile) සවිකරීමේ උස මීටර් 1.97 ක්	බිම් ඇතුරුම් හා බිත්ති ඇතුරුම් සඳහා මිනුම් ගැනීමේදී wastage සඳහා ද ප්‍රමාණයන්ට එකතු කර ඇති අතර මිණුම් ගැනීමේදී ගන්නා ලද ටේප් පටියේ නිරවද්‍යතාවය අනුව හා බැම්මෙහි උස සටහන් කිරීමේදී 1.79 කියවීමේ දෝෂයක් නිසා 1.97 ලෙස සටහන් කරගෙන ඇති විය හැකි බැවින් එම වැඩිපුර ගෙවීම අදාල කොන්ත්‍රාත්කරු වන මහනුවර විවිධ සේවා සමුපකාර සමිතියෙන් අයකරගැනීමට කටයුතු කරන බව.	අධීක්ෂණ නිලධාරීන්ගේ නිසි අධීක්ෂණය යටතේ නිවැරදිව මිණුම් ලබාගෙන ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

ලෙස දක්වා ඇතත් භෞතික පරීක්ෂාවේ උස මීටර් 1.79 ක් බව නිරීක්ෂනය වූයෙන් වර්ග මීටර 10.16 කට රු.2481 බැගින් රු.25,207 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.10 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්යය මණ්ඩලය තථ්‍ය කාර්යය මණ්ඩලය සමඟ සැසඳීමේදී ක්ෂේත්‍ර 04 ක පුරප්පාඩු 317 ක් පැවති අතර ක්ෂේත්‍ර 03 ක තනතුරු 36 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් ආයතනයේ කාර්යය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.	පුරප්පාඩු සඳහා සුදුසු නිලධාරීන් බඳවා ගැනීම් සිදු කර දෙන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කරගෙන මහජන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යා යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, මියගිය, සේවය අතහැර ගිය හා වැඩ තහනම් කල නිලධාරීන් 196 කගෙන් රු. 17,941,033 ක් අයකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 06 දෙනෙකුගේ රු.783,647 ක ණය ශේෂ වසර 02 ත් වසර 04 ත් අතර කාලයක සිට නිරවුල් කර නොතිබුණි.	මිය ගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	හිඟ ණය ශේෂ අයකර ගැනීමට හා නිරවුල් කළ යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.